**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය**
**පාසල් මට්ටම**

**09 ශ්‍රේණිය** **පද්‍ය නිර්මාණ හා අවබෝධය**
**කාලය පැය 01.30 යි.**

**1 කොටසට අයත් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .**

**11කොටසේ 'අ' 'ආ' යන ප්‍රශ්න දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.**

(1) පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තෙයි තන තම්දෙන තානේ - මල් නැටුම්නටන තාලේ
පාවෙනා වලාවේ - සිත සතුටු වෙලාවේ
ගම්මානෙ පුරා සරා මනාවා - මට රහස් කියා සිනා ගෙනාවා
ඇල දොලේ ඔහේ කතාබහේ මාළු යාළුවේ - ගුම් දීදී සුවඳ මල් ඉඹිනා බිඟු කුමාරයෝ
ආඩම්බරයිලු මාල බැඳපු මාල ගිරව්යෝ - මට යාළුකමට කතා කළා මල් කුමාරයෝ

1. මෙම ගීතයේ වස්තු විෂය කුමක් ද
2. මෙහි සඳහන් වන පරිසර සිදුවීමක් ඔබේ වචනයෙන් ලියන්න
3. මාල ගිරවියන් ආඩම්බර වී ඇත්තේ ඇයි
4. 'මල් නැටුම් නටන තාලේ යන්නෙහි අරුත කුමක් ද (ලකුණු 10)

(2) පහත කවි පැනවලට එම විරිතෙන් ම පිළිතුරු කවි සපයන්න (ලකුණු 20)

නෙක දුක් විඳදරා ඇතිදැඩි කර පෙමිනේ
....................................................................................................
ඇහැ පිය වුණේ නෑ නුඹ ගැනමයි හිතුනේ
....................................................................................................
කරදඬු උස් වෙලා මුල අමතක වන්නේ
....................................................................................................
දෙමාපියන්ට ඇයි ගැරහුම් මගෙ පුතුනේ
....................................................................................................

අත්තම්මා කන්ද දිහා බලා සුසුම්ලන්නේ
..........................................................................................
හෝ හෝ ගා ගැලුවලුනේ දිය කඳුරු පුරානේ
..........................................................................................
දැහැට දැන් පුංචි ම ඉරි වගේලු පෙනෙන්නේ
..........................................................................................
උන්දැගෙ ඇස් පෙනීම ගැන මොක ද හිතෙන්නේ
..........................................................................................

(3)පහත සඳහන් කවි පැනය සඳහා අදාළ විරිත හා එළිමසමය එක පිළිතුරු කවි පද දෙක ලියන්න

කොමලිය කළු ගංගා

දිය යට මිණි හංගා (ලකුණු 10)

(4) පහත දැක්වෙන චිත්‍රය නිරීක්ෂණය කර ඔබට හැඟෙන අදහස් ඇසුරෙන් කවියක් ලියන්න



(ලකුණු 10)

**11 කොටස** (ලකුණු 50)

(අ) සිරිපා කඳු මුදුන කරුණා කළ ඔබට හාත්පස පෙනෙන සොඳුරු අසිරිය ගැන පද්‍ය 5ක් තනන්න

(ආ)කලා වැවේ නිල් දිය රැළි දෙස බලා සිටින ඔබේ සිතට දැනෙන අදහස් ඇසුරෙන් පද්‍ය 5ක් තනන්න